# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1874/5 - 2014 අගෝස්තු මස 05 වැනි අඟහරුවාදා - 2014.08.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති හා නාගරික සංවර්ධන විෂයභාර අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම මෙහි පහත සඳහන් උපලේඛනයන්හි විස්තර කර ඇති ඉඩම් කොටස පොදු කටයුතු සහ ආගමික කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා ගැනීමට වහා අවශ්‍යව ඇති බව මාගේ මතය වන හෙයින්, එකී ඉඩම් කොටස් අදාළ කාර්යය සඳහා අවශ්‍ය බව මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2014 ජූලි මස 28 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොළඹ මහ නගර සභා සීමාව තුළ බ්ලූමැන්ඩල් හි පිහිටි බලයලත් මිනින්දෝරු හා තලමිතිකරු පී. සී. ප්‍රනාන්දුපුල්ලේ මහතා විසින් 1992.09.17 දින පිළියෙල කරන ලද අංක 315A දරන සැලසුමෙහි කැබලි අංක 1 න් පෙන්නුම් කරන අක්. 00 රූඩ් 01 පර්. 18.12 ක් පමණ විශාල පහත සඳහන් මායිම් වලින් වට වූ ඉඩම් කොටස,

මායිම් පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | කේ. සිරිල් සී පෙරේරා මාවතේ සිට ඇති ප්‍රවේශ මාර්ගය |
| *නැගෙනහිරට* | : | කේ. සිරිල් සී පෙරේරා මාවතේ වරිපනම් අංක 478/6 ඒ දරන ඉඩම |
| *දකුණට* | : | ඇල මාර්ග රක්ෂිතය |
| *බටහිරට* | : | කොළඹ මහ නගර සභාවට අයත් ඉඩම |

08-704

1A - G 19997— 05 (2014/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*